


# අලියාන්ස්
# විශ්‍රාම සුව

## සුරක්ෂිත විශ්‍රාම දිවියක් සඳහා

අලියාන්ස් ලංකා (අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්) යනු, ජර්මනියේ මියුනික් හි ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති, රක්ෂණ හා වත්කම් කළමනාකරණය ආශ්‍රිතව ප්‍රමුඛතම මූල්‍ය සේවා සම්පාදකයකු වන අලියාන්ස් සමූහයෙහි, පූර්ණ හිමිකාරිත්වය දරණ උප සමාගම වේ.

147,000 ක කාර්ය මණ්ඩල ශක්තියෙන් සමන්විත අලියාන්ස්, ලොව පුරා රටවල් 70 කට අධික සංඛ්‍යාවක තනි හා ආයතනික සේවාලාභීන් මිලියන 100 කට පමණ සේවය සලසයි. 2020 වර්ෂයේ ලොව අංක 1 රක්ෂණ සන්නාමය ලෙස පිදුම්ලත් අලියාන්ස්, ජීවිත හා සෞඛ්‍ය රක්ෂණ ව්‍යාපාරයේ නියැලෙන ජාත්‍යන්තරයේ විශාලතම රක්ෂණ සමාගම් 5 අතුරින් එකකි.

## අලියාන්ස් විශ්‍රාම සුව

විශ්‍රාම දිවිය යනු ඔබේ සිහින සැබෑ කරගැනීමට ඇති සුවිශේෂීම කාලයයි. එම කාලය තුළ ඔබේ ආදරණීයයන් සමග සතුටින් කල් ගෙවීමටත්, ඔබේ ළමා කාලය නැවත සිහිගන්වමින් මුණුබුරු, මිණිබිරියන් සමග විනෝද වන්නටත්, ජීවිතයේ තවත් සිහිනයන් සැබෑ කරගන්නටත් ඔබට පුළුවන්. ඔබේ වෘත්තීය ජීවිත කාලය පුරාවටම ඔබ ඔබේ අනාගතය ගැනත් විශ්‍රාමය ගැනත් සිතමින් ඉතිරි කිරීමට සිතන නමුත්, ඒ අරමුදල් නිසි ලෙස කළමනාකරණය කිරීම මගින් ජීවිත කාලය පුරා ආදායමක් ලබා ගැනීමට හැකිවේද යන අවිනිශ්චිතතාවයට බොහෝ දෙනා මුහුණ දෙයි. අලියාන්ස් විශ්‍රාම සුව ඔබට අවශ්‍ය ඒ අඛණ්ඩ ආදායම ලබා දීමට සූදානම්.

විශ්‍රාමයෙන් පසු මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම ඔබට කෙතරම් වටිනවාද යන්න අප හොඳින් දන්නවා. ජීවිතයේ සැඳෑ සමයේදී ඔබේ ආදරණීයයන්ට බරක් නොවී ජීවත් වීම ඔබේ ඉලක්කය වුවත් නිසි සැලසුමක් නොමැතිවීම හේතුවෙන් බොහෝ දෙනා හට සැඳෑ සමයේ සතුට අහිමි වේ.

අපගේ විශ්‍රාම සුව සැලසුම සකසා ඇත්තේ, ඔබගේ ආදායම ඔබේ කැමැත්ත පරිදි කැමති කාලයක් සඳහා අඛණ්ඩව සපයා දීමටයි. ඔබේ ඉතිරියට විශිෂ්ට ප්‍රතිලාභ සලසන අලියාන්ස් විශ්‍රාම සුව සැලසුම සිතේ සැහැල්ලුවෙන් විශ්‍රාම දිවිය ගත කිරීමට අවශ්‍ය මූල්‍ය ස්ථාවරත්වය ඔබට සහතික කරයි.

## සැලසුම සතු සුවිශේෂී ලක්ෂණ

- විශ්‍රාම ප්‍රතිලාභ ඔබට අවශ්‍ය ලෙස ලබා ගැනීමේ හැකියාව.
  - එකවර මුදලක් ලෙස.
  - වසර 5,10,15 ක කාල සීමාවක් සඳහා අඛණ්ඩ ආදායමක් ලෙස.
- විශ්‍රාම යෑමේ දිනය, වාරික ගෙවීමේ කාල සීමාව තෝරා ගැනීමේ හැකියාව මෙන්ම අමතර වාරික ගෙවීමෙන් ඔබේ අරමුදල් වර්ධනය කර ගැනීමේ හැකියාව.
- මාසිකව, ත්‍රෛමාසිකව, අර්ධ වාර්ෂිකව මෙන්ම වාර්ෂිකව වාරික ගෙවීමේ පහසුකම්.

## සැලසුමෙන් හිමිවන ප්‍රතිලාභ

### ජීවිතය අභිමිවීමකදී

- වාරික ගෙවීමේ කාල සීමාව තුළ - රක්ෂිත මුදල හෝ ආයෝජන ගිණුමේ වටිනාකම යන දෙකෙන් වැඩි අගය.
- කල් දැමීමේ කාලය (වාරික ගෙවීම් අවසන් වූ දින සිට විශ්‍රාම ගෙවීම් ඇරඹීම දක්වා කාලය) - ආයෝජන ගිණුමේ වටිනාකම.
- විශ්‍රාම ගෙවීම් සිදුකෙරෙන කාල සීමාව තුළ - පොරොන්දුවූ පරිදි ප්‍රතිලාභීන් සඳහා විශ්‍රාම ගෙවීම් එලෙසම ගෙවනු ඇත.

### විශ්‍රාම යාමේදී

මාසික ආදායමක් ලෙස හෝ එකවර ලබාගත හැකි මුදලක්.

### වාරික ගෙවීමේ කාල සීමාව තුළ අතිරේක ප්‍රතිලාභ

- අතිරේක ජීවිත ප්‍රතිලාභය
- හදිසි අනතුරු මරණ ප්‍රතිලාභය
- පූර්ණ, නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය
- පාර්ශ්වික, නිත්‍ය අකර්මණ්‍යතා ප්‍රතිලාභය
- බරපතළ රෝග ආවරණය
- රෝහල්ගතවීමේ ප්‍රතිලාභය
- පවුල් ශල්‍ය සහ රෝහල්ගත්වීමේ වියදම් ආවරණය
  වාරිකාවරණ ප්‍රතිලාභය
- පවුල් ආදායම ප්‍රතිලාභය, මරණයකදී හෝ පූර්ණ, නිත්‍ය අකර්මණ්‍යතාවයකදී
- මාරාන්තික රෝග ප්‍රතිලාභය
- අවමංගල්‍ය වියදම් ආවරණය
- වාරික වර්ධන ප්‍රතිලාභය

## සුදුසුකම්

ඇතුලත්වීමේ අවම වයස : අවුරුදු 20 (ඊළඟ උපන් දිනයට)
ඇතුලත්වීමේ උපරිම වයස : අවුරුදු 55 (ඊළඟ උපන් දිනයට)

## විශ්‍රාම වයස

අවම විශ්‍රාම වයස : අවුරුදු 40
උපරිම විශ්‍රාම වයස : අවුරුදු 70

## රක්ෂිත මුදල

අවම : රු 50,000/-
උපරිම : වාර්ෂික වාරිකය × වාරික ගෙවීමේ කාලය හෝ
රු 1,000,000/- යන්නෙන් අවම අගය

කල් පිරීමේ උපරිම වයස : අවුරුදු 75

| | |
|---|---|
| රක්ෂණ කාල සීමාව | වාරික ගෙවීමේ කාල සීමාව, කල් දැමීමේ කාල සීමාව සහ විශ්‍රාම ගෙවීම් කාල සීමාව ඇතුළු මුළු කාල පරාසය |
| අවම වාරික ගෙවීමේ කාල සීමාව | අවුරුදු 5 |
| අවම කල් දැමීමේ කාල සීමාව | අවුරුදු 5 |
| අවම විශ්‍රාම මුදල් ගෙවීමේ කාල සීමාව | අවුරුදු 5 (මාසික ආදායමක් ලබා ගැනීම් තෝරා ඇත්නම්) |
| උපරිම වාරික ගෙවීමේ කාල සීමාව | අවුරුදු 30 |
| උපරිම කල් දැමීමේ කාල සීමාව | අවුරුදු 30 |
| උපරිම විශ්‍රාම මුදල් ගෙවීමේ කාල සීමාව | අවුරුදු 15 |
| විශ්‍රාම මුදල් ගෙවීමේ ආකාරයන් | මාසික/ ත්‍රෛමාසික/ අර්ධ වාර්ෂික/ වාර්ෂික (අවුරුදු 5, 10 හෝ 15 යන ලෙස රක්ෂණ හිමියා තෝරාගත් කාල සීමාවන් සඳහා) |

Allianz

**අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්**

සමාගම් අංක : PB 3493
25-27 වන මහල, වන් ගෝල්ෆේස් කුළුණ,
අංක 1ඒ, මැද පාර, ගාලු මුවදොර, කොළඹ 02.

දුරකථන : +94 112 300 400
විද්‍යුත් තැපැල : customerservicelife@allianz.lk
වෙබ් අඩවිය : www.allianz.lk

**සැලකිය යුතුයි**

මෙහි එන ප්‍රතිලාභ සහ ආවරණයන්, විශ්‍රාම සුව ඔප්පුව සම්බන්ධයෙන් වන සංක්ෂිප්තයක් පමණක් වන අතර සියළුම නියමයන්, කොන්දේසි සහ බැහැර කිරීම් අලියාන්ස් විශ්‍රාම සුව ඔප්පුව ප්‍රකාර වේ.